ISSN 2792-1468



ප්‍රතිපත්ති පර්යේෂණ සාරාංශය

# අපනයන සාර්ථකත්වය අඩාල කරන දේශීය බාධක ඉවත් කිරීම

## අපනයනකරුවන් ලියාපදිංචිකිරීමේ ක්‍රියාවලිය සරලකරණය හා තර්කාන්විත කිරීම අත්‍යාවශ්‍ය කර්තවයකි.

## I. සාරාංශය


අපනයන ප්‍රවර්ධනය, ශ්‍රී ලංකාව තුළ බලයට පැමිණි සෑම රජයකම ප්‍රධාන ප්‍රතිපත්තිමය ඉලක්කයක් විය. වත්මන් රජය ද සිය ආර්ථික දැක්ම මගින් පෙන්වා දී ඇත්තේ 2020 වන විට අපනයනවල අගය ඩොලර් බිලියන 20 දක්වා වර්ධනය කර ගැනීම සිය අරමුණ වන බවයි.[1]

මුළුමනින්ම දේශීය වෙළඳපොළ ඉලක්ක කර ගෙන පවතින ශ්‍රී ලංකාවේ දේශීය ව්‍යාපාරයක් අපනයන වෙළඳපොළ කරා මාරුවන විට වර්තමානයේ දී අනුගමනය කළ යුතු ක්‍රියා මාර්ගය විචාරාත්මකව විමර්ශනය කරමින් වෙරිටේ සමීක්ෂණ ආයතනය විසින් සිදු කළ අධ්‍යයනයක මූලික සොයා ගැනීම මෙම ප්‍රතිපත්ති සටහන මගින් ඉදිරිපත් කෙරේ. වර්තමාන ක්‍රියාවලිය, අනවශ්‍ය ලෙස දීර්ඝ, අකාර්යක්ෂම හා දුෂ්කර එකක් බව අධ්‍යයනයේ නිගමනය වී ඇත. මෙම ක්‍රියාවලියෙන් වැඩි වශයෙන් පීඩා විඳින්නේ ඒක පුද්ගල සහ හවුල් ව්‍යාපාර වේ. තාර්කික පදනමක් මත සාධාරණීකරණය කළ නොහැකි මෙම අනවශ්‍ය පියවරයන් පවතින්නේ, අපනයන කිරීමේ හැකියාව අත්පත් කර ගැනීම සඳහා, ශ්‍රී ලංකාවේ ප්‍රධාන අපනයන ප්‍රවර්ධන නියෝජිතායතනය වන අපනයන සංවර්ධන මණ්ඩලයේ (අප.සං.මණ්)[2] ලියාපදිංචි වීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරාලීමේ දී ය. වර්තමාන අපනයන ක්‍රියාවලිය තුළ කේන්ද්‍රීය වන රජයේ වෙනත් ආයතන දෙකක් වන දේශීය ආදායම් දෙපාර්තමේන්තුව (දේ.ආ.දෙ) හා ශ්‍රී ලංකා රේගුව (ශ්‍රී.ලං.රේ) තුළ ලියාපදිංචිය ලබා ගැනීමේ දී ද මෙකී අප.සං.මණ්. හි ලියාපදිංචිය ලබා ගැනීම පූර්ව අවශ්‍යතාවයකි.

වර්තමාන ලියාපදිංචි ක්‍රියාවලිය හඳුන්වා දී ඇත්තේ නව අපනයනකරුවන් හඳුනා ගැනීම හා ඔවුන්ට සහාය වීම ඉලක්ක කර ගනිමින් වුවත් එය ක්‍රියාවට නැංවී ඇත්තේ එකී අරමුණට බරපතල ලෙස බාධා වන අයුරින් බව මෙම ප්‍රතිපත්ති සටහනේ නිගමනය වී ඇත. වර්තමානයේ පවතින ක්‍රියාවලිය, විශාල සමාගම්වලට සාපේක්ෂව බලන කල ජාත්‍යන්තර වෙළඳපොළ වෙත ඇතුළුවීමේ දී රජයේ සහාය වැඩියෙන් අවශ්‍ය වන සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවලට (සු.ම.ව්‍ය) සහාය දෙනු වෙනුවට එයට බාධා පමුණුවන ආකාරයේ දීර්ඝ, අකාර්යක්ෂම හා දුෂ්කර එකකි.


## II. මූලික නිගමනයන්

1) වත්මන් අපනයනකරුවන් ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය දීර්ඝ, සැමට එක හා සමානව ක්‍රියාත්මක නොවන, තාර්කික පදනමක් නොමැති ක්‍රියාවලියකි.

ඒක පුද්ගල/හවුල් ව්‍යාපාරයක් සඳහා වර්තමාන ලියාපදිංචි ක්‍රියාවලිය අවම වශයෙන් පියවර 10කින් සමන්විත වන අතර විවිධ ආයතන හයක් එයට සම්බන්ධ වේ. මෙම ක්‍රියාවලිය සම්පූර්ණ වීමට සති 1-3 දක්වා කාලයක් ගත විය හැකි ය.

අපනයන අවසරපත්/බලපත් අවශ්‍ය වන අපනයන නිෂ්පාදන[3] අපනයනය කිරීමට බලාපොරොත්තු වන ව්‍යාපාර හමුවේ මෙම ක්‍රියාවලිය තවත් දීර්ඝ වේ. උදාහරණයක් ලෙස, පොල් නිෂ්පාදන අපනයන කිරීමට බලපත් අවශ්‍ය වන බැවින් එසේ කිරීමට බලාපොරොත්තු වන ව්‍යාපාරවලට ඒ බලපත්‍රය ලබා ගැනීමේ ක්‍රියාවලිය සඳහා සති 2-4 දක්වා අමතර කාලයක් වැය වනු ඇත. එවිට අපනයනකරුවෙකු ලෙස ලියාපදිංචිය සඳහා ගත වන මුළු කාලය සති 3-7 දක්වා දිග් ගැසෙනු ඇත.

ක්‍රියාවලියට අයත් වන බොහෝ පියවර සඳහා පැහැදිලි සාධාරණ හේතු නැත. උදාහරණයක් ලෙස දක්වතොත්, සෙසු අධිකාරීමය ආයතන තුළ ලියාපදිංචි වීම සඳහා ද ලේඛනමය පූර්ව අවශ්‍යතාවයක් වන, අප.සං.මණ්.යේ අනිවාර්ය ලියාපදිංචිය ලබා ගැනීමේ දී, ඊට පදනම් කර ගන්නේ ග්‍රාම නිලධාරීවරයා (ග්‍රා.නි) විසින් ව්‍යාපාරය ගැන සිදු කරන ස්ථානීය තක්සේරුවකි. ස්ථානීය තක්සේරු සිදු කිරීම සඳහා ග්‍රා.නි.න් පුහුණු කර නොමැති සේම, අපනයන සිදු කිරීම සඳහා ව්‍යාපාරයක් සතු යෝග්‍යතාවය මැන බලන පැහැදිලි උපමානයන් ගොනුවක් ඔහුට/ඇයට සපයා දී නොමැත.

එමෙන්ම, මෙම ක්‍රියාවලිය අදාළ ආයතන විසින් සෑමවිටම එක හා සමානව ක්‍රියාවේ යොදවන්නේ ද නැත. උදාහරණයක් ලෙස සමහර ප්‍රාදේශීය ලේකම් කාර්යාල (ප්‍රා.ලේ.කා), ලියාපදිංචිය සඳහා, ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවෙන් (ආ.අප.දෙ.) අනුමැති ලිපියක් අවශ්‍ය බව පවසන අතර සෙසු අය එවැනි ලිපියක් අවශ්‍ය නොමැති බව පවසයි. මෙම අනුමැතිය අවශ්‍ය ප්‍රා.ලේ.කා යටතේ ලියාපදිංචි වී ඇති ව්‍යාපාරයකට අපනයනකරුවෙකු ලෙස ලියාපදිංචිවීම වඩාත් දුෂ්කර හා දීර්ඝ කර්තවයක් වේ.

2) පවතින ක්‍රියාවලියේ අපැහැදිලි බව හා තොරතුරු හිඟ කම නිසා ව්‍යාපාරිකයින් දැඩි අපහසුතාවන්ට මුහුණ දේ.

තම ලියාපදිංචි වීමේ ක්‍රියාවලිය සම්පූර්ණ කිරීම සඳහා අවශ්‍ය තොරතුරු සොයා ගැනීමේ දී ව්‍යාපාරවලට මුහුණ දීමට සිදු වන අපහසුතා හේතුවෙන් වත්මන් ක්‍රියාවලිය අපැහැදිලි සහ දුෂ්කර ක්‍රියාවලියක් බවට පත් වී ඇත. ලියාපදිංචි වීමේ සමස්ත ක්‍රියාවලිය විස්තරාත්මකව පැහැදිලි කරන තනි තොරතුරු මූලාශ්‍රයක් නොපැවතීම නිසා අවශ්‍ය තොරතුරු සොයා ගැනීම සඳහා එක් එක් ආයතනයේ වෙබ් අඩවිය වෙත පිවිසීමට සහ / හෝ අදාළ නියෝජිතායතන වෙත යාමට ව්‍යාපාරවලට සිදු වේ. එමෙන්ම, තනි නියෝජිතායතනයක ලියාපදිංචි වීමට අදාළ තොරතුරු ලබා ගැනීමට වෙබ් අඩවි කිහිපයකට යාමට සිදුවන අවස්ථාද ඇත. උදාහරණයක් ලෙස තම ආයතන තුළ ලියාපදිංචි වීම සඳහා ගත වන කාලය පිළිබඳ තොරතුරු දේ.ආ.දෙ., අප.සං.මණ්. හා තේ මණ්ඩලයේ වෙබ් අඩවිවල සඳහන් කර නොමැත. මෙම තොරතුරු සොයා ගත හැක්කේ රජයේ තොරතුරු මධ්‍යස්ථානයේ වෙබ් අඩවිය හරහාය. තොරතුරු හිඟකමද අපනයනකරුවන් වීමට උත්සාහ දරන ව්‍යාපාරිකයන් මුහුණ දෙන තවත් ගැටලුවකි. උදාහරණයක් ලෙස, ශ්‍රී ලංකා රේගුව සමඟ ලියාපදිංචි වීමේ දී රේගු කාර්යාල නියෝජිතයෙකුගේ (customs house agent - රේ.කා.නි.) සහාය ලබා ගැනීමට අපනයනකරුවන්ට සිදු වේ. නමුත්, ශ්‍රී.ලං.රේ. සමඟ ලියාපදිංචි වී ඇති රේ.කා.නි. වරුන්ගේ ලැයිස්තුවක් පොදු මහජනයාට විවෘතව නොපවතී. වත්මන් ක්‍රියාවලියේ අපැහැදිලි බව සහ තොරතුරු හිඟකම, සු.ම.අප. කරුවන් මුහුණ දෙන ප්‍රධාන ගැටලුවකි. අවැසි තොරතුරු සොයා ගැනීමට කිහිප වතාවක් කොළඹට පැමිණීමට සිදු වන බස්නාහිර පළාතෙන් පිටත පිහිටා ඇති ව්‍යාපාර, මෙනිසා වඩාත් අපහසුතාවට පත් වේ.

## III. පර්යේෂණ සාරාංශය

1) අපනයනකරුවෙකු ලෙස ලියාපදිංචි වීමේ ක්‍රියාවලිය දීර්ඝ, සෑමට එක හා සමානව ක්‍රියාත්මක නොවන හා තර්කාන්විත පදනමක් රහිත ක්‍රියාවලියකි.

1.1 ක්‍රියාවලිය අනවශ්‍ය ලෙස දීර්ඝ වූවකි.

දේශීය වෙළඳපොළ පමණක් ඉලක්ක කර ගෙන සිටි ශ්‍රී ලංකාවේ ව්‍යාපාර අන්තර්ජාතික වෙළඳපොළ කරා තම ව්‍යාපාර පුළුල් කරන විට ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලියක් හරහා යාමට සිදු වේ. මෙම ක්‍රියාවලියට අදාලව අනුගමනය කළ යුතු පියවර සහ අවශ්‍ය ලියකියවිලි, ලියාපදිංචියේ ස්වභාවය, ලියාපදිංචි වී ඇති ස්ථානය සහ අපනයනය කරන්නට බලාපොරොත්තු වන භාණ්ඩ අනුව වෙනස් වේ.

අපනයනයන් සිදු කිරීමට බලාපොරොත්තු වන ඒක පුද්ගල/හවුල් ව්‍යාපාර සඳහා නියම කෙරී ඇති ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය පහත දැක්වෙන 1 වගුවෙහි ඉදිරිපත් කර තිබේ. මෙම ව්‍යාපාර සඳහා අදාළ ක්‍රියාවලිය අවම වශයෙන් පියවර 10 කින් යුතු අතර විවිධ ආයතන හයක් ඒ හා සම්බන්ධ වේ. සමාගම් රෙජිස්ටාර් යටතේ ලියාපදිංචි වී ඇති ව්‍යාපාරවලට (සීමාසහිත සමාගම් වැනි) මෙයින් පියවර හයක් අත් හැරිය හැකි වේ. (නිල් පැහැයෙන් අවධාරණය කර තිබේ). ඊට අමතරව, අපනයනය සඳහා බලපත්‍ර ලබා ගැනීම අවශ්‍ය වන නිෂ්පාදනවලට අදාළ කොන්දේසි අනුව හා ව්‍යාපාරය පිහිටා ඇති ස්ථානය අයත් වන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය අනුව සමහර ඒක පුද්ගල/හවුල් ව්‍යාපාරවලට තවත් අමතර පියවරයන් අනුගමනය කිරීමට සිදු වේ (කහ පැහැයෙන් අවධාරණය කර ඇත).

පහත දැක්වෙන වගුවට අනුව ඒක පුද්ගල/හවුල් ව්‍යාපාරවලට මෙම ක්‍රියාවලිය සම්පූර්ණ කිරීමට සති 1-3 දක්වා කාලයක් ගත විය හැකිය. අපනයනයට බලපත්‍ර අවශ්‍ය වන නිෂ්පාදන (වගුව 1: පියවර 4 a) අපනයනය කිරීමට බලාපොරොත්තු වන ව්‍යාපාර සඳහා මෙම කාලය තවත් දීර්ඝ වේ. උදාහරණයක් ලෙස බලපත්‍ර අවශ්‍ය පොල් ආශ්‍රිත නිෂ්පාදන අපනයනය කිරීමට බලාපොරොත්තු වන ව්‍යාපාරයක් අපනයනකරුවෙකු ලෙස පොල් සංවර්ධන අධිකාරිය තුළ ලියාපදිංචි විය යුතුය. මෙම ක්‍රියාවලියට අයත් වන පියවර පහත දැක්වෙන 1 කොටුව තුළ සාරාංශ ලෙස දක්වා ඇත. මෙම ක්‍රියාවලියට සති 2 - 4 දක්වා අමතර කාලයක් ගත වේ. ඒ අනුව, එම භාණ්ඩ අපනයනය කරන්නට බලාපොරොත්තු වන අයෙකුට අපනයනකරුවෙකු ලෙස ලියාපදිංචි වීම සඳහා ගත වන සමස්ත කාලය සති 3-7 දක්වා දිග් ගැස්සේ.

1) කොටුව: පොල් සංවර්ධණ අධිකාරියේ (පො.සං.අ.) ලියාපදිංචි වීමට අදාළ ක්‍රියාවලිය[4]

1 වන පියවර: අයදුම්කරු නිෂ්පාදකයෙකු නම් නිෂ්පාදකයින්ගේ ලියාපදිංචියක් (පොල් මද සහ පොල් මද නොවන නිෂ්පාදන සඳහා) පො.සං.අ.යේ සැකසුම් සංවර්ධන අංශය වෙතින් ලබා ගත යුතුය. (අදාළ වන්නේ නව ව්‍යාපාරවලට පමණි) අයදුම්කරු නිෂ්පාදකයෙකු නොවේ නම් පො.සං.අ.යේ සැකසුම් සංවර්ධන අංශය තුළ ලියාපදිංචි වූ නිෂ්පාදකයෙකුගේ අනුමැති ලිපියක් සහ එකී නිෂ්පාදකයාගේ ලියාපදිංචියේ පිටපතක් ලබා ගත යුතුය.)

2 වන පියවර: ගබඩා හිමිකරුවන් තම ගබඩාව සඳහා රක්ෂණ සහතිකයක් ලබා ගත යුතු ය. ස්වකීය ගබඩා නොමැති, ගබඩා පහසුකම් කුලියට ගන්නා ව්‍යාපාර, ගබඩා පහසුකම් සඳහා ගබඩා හිමිකරුගෙන් අනුමැතිය දුන් බවට ලිපියක් ලබා ගත යුතුය. මෙම ගබඩා හිමිකරු අපනයනකරුවෙකු ලෙස පොල් සංවර්ධන අධිකාරිය තුළ ලියාපදිංචි වී සිටිය යුතුය.

3 වන පියවර: නියමිත පරිදි සම්පූර්ණ කළ අයදුම්පත අනෙකුත් අවශ්‍ය ලේඛන සමඟ භාර දී ලියාපදිංචි කිරීමේ ගාස්තු ගෙවිය යුතුය. අවශ්‍ය කරන ලේඛන අතර, ව්‍යාපාර ලියාපදිංචි සහතිකය, ඉල්ලුම් පත, නිෂ්පාදක ලියාපදිංචිය/නිෂ්පාදකයාගෙන් අනුමැතිය ලබා ගත් ලිපිය, රක්ෂණ සහතිකය සහ ගබඩා නොමැති විට දී ගබඩා පහසුකම් ලබා ගැනීම සඳහා අනුමැති ලිපිය වේ.

4 වන පියවර: ගබඩා හිමිකරුවෙකු නම්, පො.ස.අ.යෙන් නියම කර ඇති ප්‍රමිතීන් සපුරා ඇති දැයි තහවුරු කර ගැනීමට ගබඩා මූලික පිරික්සුම් සිදු කෙරේ.

**ප්‍රතිපත්ති පර්යේෂණ සාරාංශය**

### වගුව 1: ව්‍යාපාර කිරීම සඳහා දැනටමත් ශ්‍රී ලංකාව තුළ ලියාපදිංචි වී ඇති ඒක පුද්ගල/හවුල් ව්‍යාපාරිකයෙකුට අපනයනකරුවෙකු ලෙස ලියාපදිංචි වීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රියාවලියේ විස්තර

| පියවර | ලියාපදිංචිය අනිවාර්යයෙන් කළ යුතු මූලික ආයතන හා එක් එක් පියවර තුළ සැපිරිය යුතු අවශ්‍යතාවයන් | ගත වන කාලය |
|---|---|---|
| | අපනයන සංවර්ධන මණ්ඩලය (අප.සං.මණ්.)<br>අප.සං.මණ්. තුළ ලියාපදිංචි වීමට නම් ව්‍යාපාර විසින් ලියාපදිංචි කිරීමේ ආකෘති පත්‍රයේ 'ව්‍යාපාරයේ ස්වභාවය' සඳහන් වන 2 වන කොලමේ 'අපනයනය' යන වචනය ඇතුළත් කළ හැකි වන පරිදි තම ව්‍යාපාර ලියාපදිංචිය සංශෝධනය කර ගත යුතු ය.[5] | |
| 1 වන පියවර<br>ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් අයදුම් පතක් ලබා ගැනීම | ව්‍යාපාරයේ ස්වභාවය සංශෝධනය කර ගැනීම සඳහා, සම්පූර්ණ කරන ලද අයදුම්පත් ව්‍යාපාර හිමිකරුවා විසින් අදාළ ප්‍රදේශයේ ලේකම් කාර්යාලයට (ප්‍රා.ලේ.කා.) (කොළඹ ප්‍රදේශයේ ආරම්භ කර ඇති ව්‍යාපාරවලට නම්, බස්නාහිර පලාතේ ව්‍යාපාර ලියාපදිංචි කිරීම් කටයුතු කරන ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව) ඉදිරිපත් කළ යුතු ය.<br><br>ප්‍රා.ලේ. කාර්යාලවල වෙබ් අඩවි හරහා අදාළ අයදුම්පත් බාගත කළ නොහැකි එනිසා, ව්‍යාපාරයක ස්වභාවය වෙනස් කර ගැනීම ව්‍යාපාරිකයාම ප්‍රා.ලේ. කාර්යාලය වෙත ගොස් ඉල්ලුම් පත් ලබා ගත යුතු ය.[6] ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මෙම ලේඛන බා ගත කර ගැනීම සඳහා තම වෙබ් අඩවිය තුළ ඉඩ සලසා ඇත. | දින 3 සිට සතියක් |
| 2 වන පියවර<br>ග්‍රාම නිළධාරීවරයා-ගෙන් නිර්දේශ ලිපියක් ලබා ගැනීම | අපනයනයන් සිදු කිරීම සඳහා ව්‍යාපාරය සතු ශක්‍යතාවය නීර්ණය කිරීම සඳහා ප්‍රදේශයේ ග්‍රාම නිළධාරීවරයා (ග්‍රා.නි.) ව්‍යාපාරික ස්ථානයට පැමිණ එම ස්ථානය පිරික්සා, අපනයනකරුවෙකු ලෙස ලියාපදිංචි වීමට කර ඇති ඉල්ලීම සාධාරණීකරණය කළ හැකි බව ප්‍රකාශ කරමින් ලිපියක් ලබා දිය යුතුය.[7] | |
| 3 වන පියවර<br>ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඇති ව්‍යාපාර ලියාපදිංචිය සංශෝධනය කිරීම | 'ව්‍යාපාරයේ ස්වභාවය' යන කොලමේ 'අපනයනය' යන්න ඇතුළත් කර ඇති සංශෝධිත ව්‍යාපාර ලියාපදිංචි ආකෘතිපතක් ලබා ගැනීම සඳහා ව්‍යාපාර හිමිකරු සම්පූර්ණ කළ අයදුම්පත, ග්‍රා.නි.ගෙන් ලබා ගත් නිර්දේශ ලිපිය හා දිවුරුම් ප්‍රකාශයක් බාර දිය යුතුය. | |
| 3 a පියවර<br>ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවෙන් අනුමැති ලිපියක් ලබා ගැනීම | ඉහත දැක්වෙන ඒවාට අමතරව, ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවේ (ආ.අප.දෙ.) අනුමැතිය ද සමහර ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල නිලධාරීන් ඉල්ලා සිටී. එහි අරමුණ ව්‍යාපාරය විසින් අපනයනය කිරීමට බලාපොරොත්තු වන නිෂ්පාදන ශ්‍රී ලංකාවෙන් අපනයනය කිරීමට අවසර ඇත්දැයි පිරික්සීම ය. | සති 1 (ලිපිය තැපෑලෙන් යවන්නේ නම් පුද්ගලිකව ගොස් ලබාගන්නේ නම් දින 1 - 2) |

## ප්‍රතිපත්ති පර්යේෂණ සාරාංශය

### වගුව 1: ව්‍යාපාර කිරීම සඳහා දැනටමත් ශ්‍රී ලංකාව තුළ ලියාපදිංචි වී ඇති ඒක පුද්ගල/හවුල් ව්‍යාපාරිකයෙකුට අපනයනකරුවෙකු ලෙස ලියාපදිංචි වීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රියාවලියේ විස්තර

| පියවර | ලියාපදිංචිය අනිවාර්යයෙන් කළ යුතු මූලික ආයතන හා එක් එක් පියවර තුළ සැපිරිය යුතු අවශ්‍යතාවයන් | ගත වන කාලය |
|---|---|---|
| 4 වන පියවර<br>අප.සං.මණ්. යෙන් තාවකාලික ලියාපදිංචිය ලබා ගැනීම | අප.සං.මණ්.යෙන් ලබා දෙන මාස තුනක කාලයක් සඳහා වලංගු වන තාවකාලික සහතිකය ලබා ගැනීම සඳහා අප.සං.මණ්.යේ ලියාපදිංචිය සඳහා වූ අයදුම්පත සම්පූර්ණ කර, සංශෝධිත ව්‍යාපාර ලියාපදිංචි ආකෘති පත්‍රය සමඟ අප.සං.මණ්ට භාර දිය යුතුය.[8] | මිනිත්තු 30 |
| 4 a පියවර<br>බලපත්‍ර නිකුත් කිරීමේ නියෝජිතායතන තුළ ලියාපදිංචි වීම | ශ්‍රී ලංකාවෙන් අපනයනය කරන නිෂ්පාදන ගණනාවක් සඳහා, එකී නිෂ්පාදන අංශය අධීක්ෂණය කරන නියෝජිතායතන වෙතින් අපනයන අවසර පත්/බලපත් ලබා ගැනීම සඳහා අදාල ආයතනවල ලියාපදිංචි විය යුතුය.[9]<br><br>මෙකී නිෂ්පාදන අපනයනය කිරීම සඳහා බලාපොරොත්තු වන ව්‍යාපාර, අප.සං. මණ්. තුළ ලියාපදිංචියට පෙර අදාළ අධිකාරීමය ආයතන තුළ ලියාපදිංචිය සම්පූර්ණ කර තිබිය යුතු යැයි අප.සං.මණ්. නියම කර තිබේ.[10] | සති 2 - 4 |
| **දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුව (දේ.ආ.දෙ.)**<br>(ආදායම් බදු හැඳුනුම් අංක ලියාපදිංචියක් සහ වැට් සහතිකයක් දැනටමත් ඇති ව්‍යාපාර සඳහා මෙම පියවර අදාළ නොවේ)[11] | | |
| 5 වන පියවර<br>ආදායම් බදු හැඳුනුම් අංක ලියාපදිංචිය (ආ.හැ.අං.) | අපනයනය සිදු කරන අවස්ථාවේ දී අදාළ වන බදු ගෙවීම් සඳහා සෑම අපනයනකරුවෙකුටම දේ.ආ.දෙ ලබාගත් ආ.හැ.අං. යක් අනිවාර්යයෙන් තිබිය යුතුය.[12] | මිනිත්තු 30 |
| 6 වන පියවර<br>අගය එකතු කළ අගය මත පනවන බද්ද (වැට් සඳහා ලියාපදිංචිය) | ආ.හැ.අං ලබාගත් පසු එකී අංකය ලබා ගැනීම සඳහා යොදා ගත් ලේඛන ගොනුවම, එම ආයතනයේ තවත් අංශයකට ඉදිරිපත් කර වැට් ලියාපදිංචිය ලබා ගත යුතුය.[13] | මිනිත්තු 30 |
| **ශ්‍රී ලංකා රේගුව (ශ්‍රී ලං.රේ.)** | | |
| 7 වන පියවර<br>ග්‍රා.නි. විසින් ව්‍යාපාරය පිහිටි ස්ථානය සහතික කිරීම | රේගුවේ ලියාපදිංචිය සඳහා වූ අයදුම්පත රේගුවේ වෙබ් අඩවියෙන් බාගත යුතුය. එකී ලේඛනවල සඳහන් ව්‍යාපාරය පිහිටි ස්ථානය/ලිපිනය තහවුරු කරමින් අදාළ ග්‍රා.නි. විසින් මෙම අයදුම්පතේ 10 වන කොටසේ සිය අනුමැතිය සඳහන් කර අත්සන් කළ යුතුය.[14] | දින 1 |

වගුව 1: ව්‍යාපාර කිරීම සඳහා දැනටමත් ශ්‍රී ලංකාව තුළ ලියාපදිංචි වී ඇති ඒක පුද්ගල/හවුල් ව්‍යාපාරිකයෙකුට අපනයනකරුවෙකු ලෙස ලියාපදිංචි වීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රියාවලියේ විස්තර

| පියවර | ලියාපදිංචිය අනිවාර්යයෙන් කළ යුතු මූලික ආයතන හා එක් එක් පියවර තුළ සැපිරිය යුතු අවශ්‍යතාවයන් | ගත වන කාලය |
|---|---|---|
| 8 වන පියවර<br>ශ්‍රී ලංකා රේගුවේ ලියාපදිංචිය සඳහා රේගු කාර්යාල නියෝජිතයෙකු (රේ.කා.නි.) ගේ සේවය ලබා ගැනීම | රේගුවේ ලියාපදිංචිය සඳහා වූ අයදුම්පතේ 7 වන කොටසේ නියම කර ඇති පරිදි රේ.කා.නි. ගේ නම සහ ලිපිනය අනිවාර්යයෙන්ම ලබා දිය යුතුය.<br><br>රේගුව විසින් නිකුත් කර ඇති විශේෂ උපදෙස් මාලාවේ සඳහන්ව ඇති අන්දමට සහ අදාළ නිලධාරීන් සමඟ සිදු කළ සම්මුඛ සාකච්ඡාවලට අනුව ශ්‍රී ලංකා රේගුවේ ස්වයංක්‍රීය (ASYCUDA)[15] පද්ධතිය වෙත අයදුම්කරුගේ තොරුතුරු උඩුගත කිරීම සඳහා ද රේ.කා.නි.කෙනෙකුගේ සහය ලබා ගත යුතුය.[16]<br><br>අපනයනකරුවන්ට රේ.කා.නි.වරුන්ගේ ලැයිස්තුවක් රේගුවේ මානව සම්පත් දෙපාර්තමේන්තුවෙන් ලබා ගැනීමට හෝ රේගු පරිශ්‍රයේ රැඳී සිටින රේ.කා.නි.වරුන්ගේ සේවාවන් වෙත යොමු විය හැකිය. මෙම සේවය සඳහා ඉල්ලුම්කරුවන් විසින් රේ.කා.නි.වරුන්ට ගෙවීමක් සිදු කළ යුතුය. | දවස් 2 |
| 9 වන පියවර<br>ශ්‍රී ලංකා රේගුව තුළ ලියාපදිංචි වීම | පද්ධතියට (8 වන පියවරේ සඳහන් කර ඇති) අදාළ තොරතුරු උඩුගත කළ පසු. සම්පූර්ණ කරන ලද අයදුම්පත එම නිශ්චිතව දක්වා ඇති අනෙකුත් ලේඛන සමඟ අපනයනකරුවා විසින් ශ්‍රී.ලං.රේ. හි ආ.හැ.අං. හා වැට් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවට බාර දිය යුතුය. අයදුම්පතේ නිශ්චිතව සඳහන් අනෙකුත් ලේඛන අතර, අප.සං.මණ්. සහතිකය, ආ.හැ.අං. සහතික සහ වැට් සහතික හා ඉඩම් ඔප්පු, ජල හාවිදුලි බිල්පත් යනාදී ලිපිනය තහවුරු කිරීම සඳහා අවශ්‍ය වෙනත් ලේඛන ද වේ. මෙම ලේඛන බාරදුන් පසුව රේගුව තුළ ලියාපදිංචි වීමේ ක්‍රියාවලිය සම්පූර්ණ වේ. | පැය කිහිපයක සිට එක් දිනයක් දක්වා |
| | අපනයන සංවර්ධන මණ්ඩලය | |
| 10 වන පියවර<br>අප.සං.මණ්. යෙන් ලියාපදිංචියේ ස්ථිර සහතිකය ලබා ගැනීම | 'කැපී පෙනෙන' අගයකින් යුතු අපනයනයන් දෙකක් හෝ තුනක්[17] ('කැපී පෙනෙන බව තහවුරු කිරීම සඳහා කොපමණ අගයකින් හෝ ප්‍රමාණයකින් යුතු අපනයනයන් සිදු කළ යුතු දැයි පැහැදිලි නැත') අපනයනකරු විසින් සිදු කළ පසු ව්‍යාපාරයට අප.සං.මණ්.යේ ස්ථිර ලියාපදිංචිය සඳහා අයදුම් කළ හැකිය. | විචල්‍ය වේ |

1.2 ව්‍යාපාරිකයන් අනුගමනය කළ යුතු බවට දක්වා ඇති පහත පියවරවලට තර්කානුකූල පදනමක් නොමැත.

- 'අපනයනය' යන වචනය ඇතුළත් වන පරිදි ව්‍යාපාර ලියාපදිංචියේ 'ව්‍යාපාරයේ ස්වභාවය' වෙනස් කිරීමේ අවශ්‍යතාවය.

1 වන වගුවේ ලැයිස්තුගත කර ඇති ඒක පුද්ගල ව්‍යාපාර/හවුල් ව්‍යාපාර සඳහා අදාළ වන එකෙහි සිට තුන දක්වා වන පියවර හට ගැනී ඇත්තේ 1985 ජුනි 27 වන දිනැති අංක 355/14 දරන අතිවිශේෂ ගැසට් නිවේදනය ප්‍රකාරවය. ශ්‍රී ලංකාවෙන් අපනයනය කිරීම සඳහා සුදුසුකම් ලබා ගැනීමට අපනයන සංවර්ධන මණ්ඩලයේ ලියාපදිංචි වීම ඉන් අනිවාර්ය කර තිබේ. අප.සං.මණ්.හි ලියාපදිංචිය සඳහා, 'අපනයනය' යන වචනය ඇතුළත් වන පරිදි තම ව්‍යාපාරයේ ස්වභාවය ලියාපදිංචිය සංශෝධනය කිරීමට ව්‍යාපාර විසින් තම ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත අයදුම් කළ යුතුය.[18] අප.සං.මණ්.ට අනුව ලියාපදිංචි වීම සඳහා ඇති වර්තමාන ක්‍රියාවලියේ අරමුණ වන්නේ අප.සං.මණ්.යේ සහාය ලබා දිය හැකි, අපනයනය සිදු කිරීම සඳහා සූදානම් ව්‍යාපාර/නිර්ව්‍යාජ අපනයනකරුවන් හඳුනා ගැනීම හා නව අපනයනකරුවන් හඳුනා ගැනීමය.[19]

කෙසේවුවත් අපනයන සංවර්ධන මණ්ඩලයේ ඉලක්ක කරා ළඟා වීමට වර්තමාන ක්‍රියාවලියෙන් සහායක් ලැබේදැයි අතිශයින් අවිශ්වාස සහගතය. 'අපනයනය' යන වචනය ඇතුළත් වන පරිදි ව්‍යාපාරයේ ස්වභාවය වෙනස් කිරීමට ප්‍රා.ලේ. කාර්යාල ගනු ලබන තීරණය රඳා පවතින්නේ ව්‍යාපාරය පිහිටි ස්ථානය පිරික්සා බලා ග්‍රාම නිලධාරී (ග්‍රා.නි) විසින් අපනයනය කිරීමට ව්‍යාපාරය සතු ශක්‍යතාවය පිළිබඳ ලබාදෙන නිර්දේශය මත ය. යම් ව්‍යාපාරයක් අපනයනය සඳහා සූදානම් එකක් යැයි සැලකීමට සපුරාලිය යුතු සුදුසුකම් පිළිබඳ ග්‍රා.නි.වරුන්ට ඇත්තේ සීමිත දැනුමකි. එසේම, විෂයමූලික සහ සාධාරණ තක්සේරුවක් කිරීම සඳහා ඔහුට/ඇයට උපයෝගී කර ගත හැකි අන්දමේ උපමානයන් හෝ මාර්ගෝපදේශ ලැයිස්තුවක් ඔවුන්ට ලබා දී නොමැත. මෙවැනි පසුබිමක් තුළ වත්මන් ක්‍රියාවලිය, ශ්‍රී ලංකාව තුළ ඇති නිර්ව්‍යාජ/අපනයනයට සූදානම් ව්‍යාපාර හඳුනා ගැනීමේ විශ්වාසදායි සහ ප්‍රයෝජනවත් ක්‍රමයක් ලෙස සැලකීමට අපහසුය.

නව අපනයනකරුවන් හඳුනා ගැනීමට අදාළව ශ්‍රී ලංකා රේගුවට මීට වඩා විශ්වාසදායි තොරතුරු අප.සං.මණ්.ට ලබා දිය හැකිය. සිදු කරන සෑම අපනයනයක්ම ශ්‍රී.ලං.රේ.හි වාර්තාගත වන බැවින් දෙන ලද යම් කාල පරිච්ඡේදයක් තුළ පළමුවරට අපනයනයන් සිදු කරන සමාගම්වල ලැයිස්තුවක් අප.සං.මණ්.ට, රේගුවෙන් පහසුවෙන් ලබා ගත හැකිය. ග්‍රා.නි. වෙතින් ලබා ගන්නා නිර්දේශ ලිපියක් මත රඳා පවතින ක්‍රියාවලියකට සාපේක්ෂව ශ්‍රී ලංකා රේගුවේ දත්ත ගබඩාව නව අපනයනකරුවන් හඳුනා ගැනීම සඳහා වඩා විශ්වාසදායි මූලාශ්‍රයක් වනු ඇත.

ඒ අනුව බලන කල අපනයන සඳහා සූදානම් ව්‍යාපාර සහ නව අපනයනකරුවන් පිළිබඳ රඳා පැවතිය හැකි තොරතුරු උත්පාදනයෙහි ලා අසමත් වත්මන් ක්‍රියාවලිය තර්කානුකූල නොවන මෙන්ම ඵලදායි නොවන ක්‍රියාවලියකි. ඉන් සිදු කෙරෙන්නේ දේශීය වෙළඳ පොළ මත පමණක් කේන්ද්‍රගත වූ ව්‍යාපාරයක සිට අපනයනය කෙරෙහි යොමු වූ ව්‍යාපාරයක් දක්වා මාරු වන්නට උත්සාහ දරන ව්‍යාපාර මත අමතර බරක් පැටවීමක් පමණි. මෙම ගැටළුවලට අමතරව වර්තමාන ක්‍රියාවලිය අපයෝජනයට ලක්වීමේ අවදානමක් ද තිබේ. උදාහරණයක් ලෙස බැංකු ණයක් සඳහා අයදුම්කරන ව්‍යාපාරයක විශ්වාසනීයභාවයේ සලකුණක් ලෙස අප.සං.මණ්.යේ අපනයන ලියාපදිංචි සහතිකයට බැංකු විසින් ඉහළ අගයක් ලබාදෙන බැවින් ණයක් ලබා ගැනීමේ ඉඩ ප්‍රස්ථා වැඩි කර ගැනීම සඳහා අප.සං.මණ්. සහතිකය සමහර ව්‍යාපාර විසින් ලබා ගන්නේ යැයි කියවේ.[20]

අප.සං.මණ්.යේ ලියාපදිංචිය ලබා ගැනීම ස්වේච්ඡාමය කළහොත්, අපනයනකරුවෙකු ලෙස ලියාපදිංචි වීමේ ක්‍රියාවලිය පියවර 5ක් දක්වා (ඉහත 1 වන වගුවේ ඇති පියවර 5 සිට පියවර 9 දක්වා) අඩු කළ හැකිය. එමෙන්ම ස්වේච්ඡාමය ලියාපදිංචිය, අප.සං.මණ්. මඟින් සපයන සේවාවන්ට අපනයනකරුවන් ලබා දෙන ඇගයීම පිළිබඳ මිණුම් දණ්ඩක් බවට ද පත් වනු ඇත. අපනයනකරුවන්ට සහාය වීමේ රාජකාරිය පැවරී ඇති අප.සං.මණ්. වැනි ආයතනවලට තමන්ගේ අගය අපනයනකරුවන්ට දැනෙන පරිදි තම සේවාවන්ගේ ගුණාත්මකභාවය හා ඵලදායීත්වය තව දුරටත් වැඩි කිරීම සඳහා එවැනි යාන්ත්‍රණයන් මගින් දිරි ගැන්වීමක් ද සිදු කෙරෙනු ඇත.

- අප.සං.මණ්. හා ආ.බ.දෙ. තුළ ලියාපදිංචි වීමට පෙර බලපත්‍ර ලබා දෙන අධිකාරී ආයතන තුළ ලියාපදිංචි වීමේ පූර්ව අවශ්‍යතාවය.

වර්තමානයේ දී, අප.සං.මණ්. සහ ආ.බ.දෙ., තම ආයතන තුළ ලියාපදිංචිය ලබා ගැනීමේ පූර්ව අවශ්‍යතාවයක් ලෙස යම් යම් නිෂ්පාදනයන්ට අදාළව ඇති බලපත්‍ර ලබාදෙන ආයතන තුල ලියාපදිංචි සහතික, ව්‍යාපාර හිමිකරුවන් විසින් ඉදිරිපත් කළ යුතු යැයි නියම කර තිබේ. ප්‍රධානකොටම මෙම ලියාපදිංචි කිරීම් සහ අවසර පත් ලබා දීමේ අරමුණ වන්නේ අදාළ ආයතන විසින් නියම කර ඇති නිෂ්පාදන ප්‍රමිතීන්ට සහ රෙගුලාසිවලට අනුකූලව කරන නිෂ්පාදන බවට සහතික කිරීමත්, තහනම් ද්‍රව්‍ය අපනයනය නොකරන බවට සහතික කර ගැනීමත් ය. එබැවින් මෙම සහතික/බලපත්‍ර ඉදිරිපත් කිරීම වැදගත් වන්නේ එම භාණ්ඩ රටින් පිටට ගෙන යන අවස්ථාවේදීය. එවැනි නිෂ්පාදනයන් හා බැඳුණු අපනයනකරුවන් විසින් යම් අපනයනයක් කරන අවස්ථාවක දී මෙම බලපත්‍ර සහ සහතික ශ්‍රී ලංකා රේගුව වෙත ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ. මෙම ලේඛන නොමැති අපනයනය සිදු කිරීමට, රේගු නිලධාරීන් අපනයනකරුට ඉඩ දෙනු නොලැබේ. මෙවැනි පසුබිමක් තුළ, අප.සං.මණ්. හා ආ.බ.දෙ. තුළ ලියාපදිංචි වීමේ දී පූර්ව අවශ්‍යතාවයක් ලෙස මෙම බලපත්‍ර ලබා දෙන ආයතන සමඟ ලියාපදිංචි වීම අනිවාර්ය කිරීමේ තර්කානුකූල පදනම අපැහැදිලි ය.

එමෙන්ම, අප.සං.මණ්. සහ ආ.බ.දෙ. තුළ මුලින්ම ලියාපදිංචි වීමේ අවස්ථාවේ යම් නිෂ්පාදනවලට අදාළ ලියාපදිංචි කිරීම් ඉදිරිපත් නොකළේ වුවද, ලියාපදිංචි අපනයනකරුවෙකුට මෙකී නිෂ්පාදන පසු කාලයක දී අපනයනය කිරීමට එය බාධාවක් නොවේ. ඒ සඳහා ඔවුන් කළ යුතු වන්නේ නිෂ්පාදනයට අදාළ බලපත්‍ර ලබාදෙන නියෝජිතායතනයෙන් අදාළ අවසර පත්‍රය ලබාගෙන, අපනයනය සිදු කරන අවස්ථාවේ දී ශ්‍රී ලංකා රේගුව වෙත බාර දීම පමණි. ඒ අනුව අප.සං.මණ්.යේ හා ආ.බ.දෙ. වේ ලියාපදිංචිය සඳහා කරන මෙම පූර්ව අවශ්‍යතාවය සාධාරණීකරණය කළ නොහැක.

1.3 ලියාපදිංචි ක්‍රියාවලිය සැමට එක හා සමානව ක්‍රියාත්මක නොවීම නිසා ඇතැම් ව්‍යාපාරවලට එය වඩාත් දුෂ්කර ක්‍රියාවලියක් බවට පත් වී තිබේ.

- ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවෙන් (ආ.අප.පා.දෙ.) ලිපියක් ලබා ගත යුතු වීම.

අයදුම්කරුගේ නිෂ්පාදනය අපනයනය කිරීම සඳහා අවසර ඇති බව තහවුරු කර ගැනීමට ආ.අප.පා.දෙ.න් අනුමැතියක් ලබා ගැනීම සමහර ප්‍රා.ලේ.කා. විසින් තවමත් පූර්ව අවශ්‍යතාවයක් ලෙස සලකයි. මෙම අනුමැතිය ලබා ගන්නේ අපනයනකරුගේ නිෂ්පාදනයේ විස්තර සඳහන් කරමින් ආ.අප.පා.දෙ.ට ලිපියක් යැවීම මඟිනි. ඉන්පසුව ආ.අප.පා.දෙ. විසින් තම අනුමැතිය ප්‍රා.ලේ. වෙත සන්නිවේදනය කරයි. ආ.අප.පා.දෙ. වේ. අනුමැතිය ඉල්ලා සිටින ප්‍රා.ලේ. කාර්යාලයක ලියාපදිංචි වී ඇති ව්‍යාපාරයක් තම ව්‍යාපාරයේ ස්වභාවය "අපනයනය" යන යෙදුම ඇතුළත් වන පරිදි සංශෝධනය කිරීමේ ක්‍රියාවලිය, මෙම අනුමැතිය ඉල්ලා නොසිටින ප්‍රා.ලේ. කාර්යාලයක ලියාපදිංචි වී ඇති ව්‍යාපාරයක් සඳහා අදාළ ක්‍රියාවලියට ගතවන කාලයට වඩා දීර්ඝ වේ. ලියාපදිංචිය සිදු කිරීමේ දී ප්‍රා.ලේ. කොට්ඨාශ හරහා ලිපිය තැපෑලෙන් යවන්නේ නම් සතියක් ද, ආ.අප.පා.දෙ. වෙත හා ආපසු එම ලිපිය පුද්ගලිකව රැගෙන යන්නේ නම් දින 1 - 2 දක්වා ද අමතර කාලයක් ගත වේ.[21] එක සමාන ප්‍රතිපලයක් ලබා ගැනීම සඳහා විවිධ ප්‍රා.ලේ. කාර්යාල විසින් ඉල්ලා සිටින ලේඛන අවශ්‍යතාවල ඒකීයත්වයක් නොමැති වීම නිසා මෙම ක්‍රියාවලිය ඇතැම් ව්‍යාපාර වලට අනිසි බරක් පටවන ක්‍රියාවලියක් බවට පත් වී ඇත.

- රේගු කාර්යාල නියෝජිතයෙකුගේ (රේ.කා.නි.) සේවය අනිවාර්යයෙන්ම ලබා ගත යුතු වීම.

රේගු නිෂ්කාශණ ක්‍රියාවලිය තුළ දී ව්‍යාපාරිකයින් සහ ශ්‍රී ලං.රේ. අතරමැදියන් ලෙස රේ.කා.නි.වරු ක්‍රියා කරති. රේගු නීති හා ක්‍රියාවලීන් පිළිබඳව ඔවුන් සතු දැනුම ද වෙළඳ සැපයුම්දාමය පිළිබඳව ඇති ප්‍රායෝගික අත්දැකීම් ද හේතුවෙන් ව්‍යාපාරිකයින්ට මෙන්ම රේගු පරිපාලනයට ද ඔවුන්ගේ සේවය එක සේ ප්‍රයෝජනවත්ය.[22] වර්තමාන ලියාපදිංචි ක්‍රියාවලිය තුළ රේ.කා.නි.වරුන්ගේ සේවය ලබා ගැනීම අනිවාර්ය දෙයක් වී ඇත.

කෙසේවෙතත් ලෝක රේගු සංවිධානයේ සංශෝධිත කියෝතෝ සම්මුතියේ (සං.කි.සම්.) මෙන්ම ලෝක වෙළඳ සංවිධානයේ වෙළඳ පහසුකාරකම් එකඟතාවයේ (වෙ.ප.එ) ප්‍රතිපාදනවලට මෙය පටහැනිය. ශ්‍රී ලංකාව මෙම ජාත්‍යන්තර ගිවිසුම් දෙකෙහිම පාර්ශවකරුවෙකි.[23]

තැරැව්කාර සේවාවන් ලබා ගැනීම ආනයනකරුවෙකු/ අපනයනකරුවෙකුට 'විකල්ප තෝරා ගැනීමක්' ලෙස පමණක් තිබිය යුතු බව සං.කි.සම්. හි දැක් වේ.[24] එමෙන්ම, ලෝ.වෙ.සං.යේ වෙළඳ පහසුකාරකම් එකඟතාවයේ (වෙ.ප.ගි.) 10.6 වගන්තියේ දැක්වෙන පරිදි "රේගු තැරැව්කරුවන්ගේ අනිවාර්ය සේවය ලබා ගැනීමක්, සාමාජිකයින් විසින් හඳුන්වා නොදිය යුතු වේ." 10.3 වගන්තිය යනු, ගිවිසුම පැනවුනු වහාම බල ගැන්වෙන, වෙ.ප.එ. යටතේ ශ්‍රී ලංකාව "A" කාණ්ඩයේ වගකීමක් ලෙස හඳුනා ගත් වගන්තියකි.

මෙම කරුණු හැරුණු කොට, රේ.කා.නි.වරුන්ගේ සේවය යොදා ගැනීම අනිවාර්ය කිරීම, අපනයනකරුවෙකු ලෙස ලියාපදිංචි වීමේ පිරිවැය-විශේෂයෙන්ම සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තවල - ඉහළ නැංවීමට ද හේතු වනු ඇත. අප.සං.මණ්. තුළ ලියාපදිංචි වීමේ දී මෙන්ම මෙහිදී ද මෙම සේවය ස්වෙච්ඡාවෙන් තොරා ගත යුතු විකල්පයක් බවට පත් කිරීම රේ.කා.නි.වරුන් අතර තරඟකාරීත්වය ප්‍රවර්ධනය කිරීමට ද, ඒ අනුව ව්‍යාපාර වෙත ඔවුන් විසින් ලබා දෙන සේවයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීමට ද හේතු වනු ඇත.

2) විනිවිදභාවයකින් තොර වීම හා තොරතුරු හිඟකම නිසා මෙම ක්‍රියාවලිය දුෂ්කර එකක් වී ඇත.

2.1 භාවිතා කරන්නාට පහසු ලෙස ලබා ගත හැකි අන්දමින් තොරතුරු නොපවතී.

තොරතුරු වෙත ප්‍රවේශය වැඩි දියුණු කිරීමේ දී, ඒවා පරිශීලනය කිරීමට පහසු වන අන්දමින් පැවතීම තීරණාත්මක වේ. ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලියට අදාළ තොරතුරු වෙබ් අඩවි ගණනාවක් පුරා විසිරී ඇති බව මෙම පර්යේෂණය තුළ දී අනාවරණය විය. එහි ප්‍රතිඵලයක් ලෙස, දැනට පවතින සම්පූර්ණ ක්‍රියාවලිය ගැන තොරතුරු සොයා ගැනීමට වෙබ් අඩවි ගණනාවක් වෙත යා යුතුව තිබේ.

උදාහරණයක් ලෙස, අපනයනකරුවන් ලියාපදිංචි කිරීම සම්බන්ධ රජයේ එක් එක් නියෝජිතායතන, තමන්ට අදාළ කොටස පිළිබඳව තම වෙබ් අඩවිවල සඳහන් කර තිබේ. නමුත් සමස්ත ක්‍රියාවලිය ලැයිස්තුගත කර ඇති හා එහි එක් එක් පියවරක් සඳහා අවශ්‍ය වන ලේඛන ගැන සඳහන් තනි ලේඛනයක් හෝ තනි වෙබ් අඩවියක් නොමැත. තම ආයතනය තුළ ලියාපදිංචි වීමට පෙර හෝ එසේ ලියාපදිංචි වීමෙන් පසු අයදුම්කරුවන් විසින් ගත යුතු පියවර පිළිබඳව ද නියෝජිතායතන බහුතරයකට දැනුවත් බවක් නොමැත. එමෙන්ම, තම ආයතන තුළ ලියාපදිංචි වීම සඳහා හෝ අවශ්‍ය අනුමැතීන් ලබාදීම සහ ගත වන කාලය පිළිබඳ තොරතුරු තම වෙබ් අඩවි හෝ තමන් විසින් පළ කරන

උපදේශ මාලා තුළ සඳහන් කර නොමැත. ඒ වෙනුවට, අප.සං.මණ්., ආ.බ.දෙ., සහ තේ මණ්ඩලය තුළ ලියාපදිංචි වීම සඳහා ගත වන කාලය ගැන තොරතුරු රාජ්‍ය තොරතුරු කේන්ද්‍රයේ වෙබ් අඩවියේ පළ කර තිබේ.[25]

2.2 ලබා දී තිබෙන තොරතුරු අසම්පූර්ණය.

ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය පිළිබඳ සීමිත තොරතුරු ප්‍රමාණයක් ලබා දෙන මාර්ගෝපදේශ මාලාවක් අප.සං.මණ්. විසින් පළ කර ඇත. ක්‍රියාවලියට සම්බන්ධ වන මූලික ආයතන තුනක් - අප.සං.ම., දේ.ආ.දෙ. සහ රේගුව - මෙන්ම අපනයනකරුවන් ලියාපදිංචි විය යුතු අදාළ බලපත්‍රදායක ආයතන මෙම මාර්ගෝපදේශ මාලා තුළ හඳුනා ගැනේ.[26] එහෙත්, මේ එක් එක් ආයතන තුළ ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය සම්පූර්ණ කිරීම සඳහා ගත වන කාලය හෝ නිශ්චිත ක්‍රියා පටිපාටි, අවශ්‍ය ලේඛන, ගාස්තු ගැන තොරතුරු මෙම මාර්ගෝපදේශ මාලාව තුළ සඳහන් වන්නේ නැත. එවැබින් අදාළ සියළු ආයතනවල සියළු කොන්දේසි තෘප්තිමත් කිරීම සඳහා මේ ආයතන සමූහය අතර රස්තියාදු වීමට ව්‍යාපාර හිමිකරුවන්ට බොහෝවිට සිදු වී තිබේ.

කලින් සඳහන් කළ පරිදි, ශ්‍රී ලංකා රේගුව සමඟ ලියාපදිංචි වීමේ වර්තමාන ක්‍රියාවලිය තුළ දී එය සම්පූර්ණ කර ගැනීම සඳහා රේ.කා.නී. වරුන්ගේ සහාය ලබා ගැනීමට නව අපනයනකරුවන්ට සිදුව තිබේ. එහෙත්, ශ්‍රී.ලං.රේ. තුළ ලියාපදිංචි වී ඇති රේ.කා.නී.වරුන් ගැන විශ්වාසනීය හා යාවත්කාලීන තොරතුරු සොයා ගැනීම දුෂ්කර වී තිබේ ශ්‍රී. ලං.රේ. තුළ ලියාපදිංචි වී ඇති අතර එම තොරතුරු ලබා ගැනීමට රේගු කාර්යාලය වෙත පුද්ගලිකව යා යුතු වේ.

වර්තමාන ක්‍රියාවලිය තුළ විනිවිදභාවයක් නොමැති වීම හා එහි තොරතුරු හිඟකම නිසා අපනයන සිදු කිරීමට බලාපොරොත්තු වන ව්‍යාපාරවලට දුෂ්කරතාවයන්ට මුහුණ දීමට සිදු වී තිබේ. අදාළ ආයතන බහුතරය පිහිටා ඇති කොළඹ නගරය වෙත ගමන් වාර ගණනාවක් යාමට සිදු වන, බස්නාහිර පළාතෙන් පිටත පිහිටා ඇති ව්‍යාපාරවලට එම දුෂ්කරතාවය වඩා තීව්‍ර වෙයි.

වර්තමාන ක්‍රියාවලිය තර්කාන්විත කිරීමෙන් හා සරල කිරීමෙන් මෙන්ම, අදාළ තොරතුරු පහසුවෙන් ලබා ගත හැකි තනි ස්ථානයක පිහිටුවීමෙන් ද එකී අදාළ තොරතුරු සොයා ගැනීමට අපනයනකරුවන්ට ගත වන කාලය හා පිරිවැය කැපී පෙනෙන ලෙස අවම කර ගත හැකි වනු ඇත. ඊට අමතරව, ක්‍රියාවලියේ දී කේන්ද්‍රීය වන ආයතන, අදාළ තොරතුරු (ගත වන කාලය, රේ.කා.නි.වරුන්ගේ ලැයිස්තුව වැනි) තම වෙබ් අඩවිවල පල කිරීමෙන් අයදුම්කරුවන්ට විඳීමට සිදු වන ගැහැට අඩු කර ගැනීමට දායක විය හැකි වේ.

## IV. නිගමනය

ශ්‍රී ලංකාව තුළ බලයට පැමිණි සෑම රජයක්ම අපනයන ප්‍රවර්ධනය සිය ආර්ථික ප්‍රතිපත්තියේ ප්‍රමුඛතාවයක් ලෙස සලකා ඇත. අපනයන සඳහා ව්‍යාපාර දිරි ගැන්වීම මෙන්ම, අපනයනයට ඇති බාධක ඉවත් කිරීම ද මීට ඇතුළත් වේ. මේ සංදර්භය තුළ, අපනයන ප්‍රවර්ධනය කිරීමේ මෙන්ම නව අපනයනකරුවන්ට සහාය වීමේ අරමුණින් යුතුව වෙනම ලියාපදිංචි වීමේ ක්‍රියාවලියක් හඳුන්වා දී තිබේ. කෙසේ වෙතත්, මෙම ක්‍රියාවලියේ සමහර අංග හේතුවෙන් එය දීර්ඝ වීම හා ආකාර්යක්ෂම වීම නිසා ඉහත ඉලක්කය යටපත් වී තිබේ. එමෙන්ම මෙම ක්‍රියාවලිය, ව්‍යාපාරවලට, විශේෂයෙන් බස්නාහිර පළාතෙන් පිටත පිහිටා ඇති ඒවාට හා, ඒක පුද්ගල/හවුල් ව්‍යාපාර ලෙස ලියාපදිංචි වී ඇති සු.ම.පරි.කර්. වලට අයුතු දුෂ්කරතාවයන් ගෙන එයි. පැහැදිලි තර්කානුකූලභාවයක් නොමැති නීති හා රෙගුලාසි අපනයනයන් කෙරෙහි ව්‍යාපාර යොමු වීම අධෛර්යමත් කරයි. රජය සපුරා ගැනීමට බලාපොරොත්තු වන අපනයන ඉලක්කවලට ළඟා වීමට මෙය බාධාවක් වනු ඇත. මේ පසුබිම තුළ, ස්වකීය අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා, මෙම ක්‍රියාවලිය වඩා සරල හා වඩා ඵලදායී එකක් බවට පත් කර ගත හැකි ආකාරය හඳුනා ගැනීමට එය ප්‍රති-ඇගයීමකට ලක් කිරීම කාලීන අවශ්‍යතාවකි.■

The Economics Research Team of Verité Research complied this study. The team comprised Mathisha Arangala and Nilangika Fernando. Editorial support was provided by Venya De Silva, Malathy Knight and Anishka Arseculаratne. Overall research and editorial supervision was provided by Subhashini Abeysinghe and Nishan de Mel.

The team would like to thank the Ceylon Chamber of Commerce and the Federation of Chamber of Commerce and Industry of Sri Lanka for facilitating this research. The team would also like to thank the Chamber of Commerce and Industry of Central Province, the Galle District Chamber of Commerce and Industry, the Trincomalee District Chamber of Commerce and Industry, the Chamber of Commerce and Industries of Yarlpanam, the Batticloa District Chamber of Commerce Industry and Agriculture, the Ampara District Chamber of Commerce and Industry, the Sabaragamuwa Province Chamber of Commerce and Industry, the Hambantota District Chamber of Commerce, the Matara District Chamber of Commerce, the Wayamba Chamber of Commerce and Industry and the Anuradhapura District Chamber of Commerce, Industry and Agriculture for their insights and support.

## සටහන්

[1] '2025 දැක්ම' (2017) http://www.pmoffice.gov.lk/download/press/D00000000061_EN.pdf හි ඇත: (2018 ජනවාරි හි දී ප්‍රවේශ වන ලදී).

[2] අපනයන සංවර්ධන මණ්ඩලය අපයන ප්‍රවර්ධනයෙහි යෙදෙන ප්‍රමුඛතම ආයතනයයි.

[3] බලපත් අවශ්‍ය නිෂ්පාදනයක් යනු එම නිෂ්පාදන අපනයනය කිරීමට එම ක්ෂේත්‍රය අධීක්ෂණය කරන ශ්‍රී ලංකාවේ නියෝජිතායතනය වලින් බලපත්/අවසරපත් ලබා ගැනීම අවශ්‍ය වන නිෂ්පාදනයකි. (ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය විසින් නිකුත් කරන ඇති "The Export Procedure of Sri Lanka" හි සඳහන් බලපත්/අවසරපත් අවශ්‍ය වන නිෂ්පාදනවල ලැයිස්තුවක් සඳහා http://www.srilankabusiness.com/බලන්න).

[4] මූලාශ්‍රයඃ පොල් සංවර්ධන අධිකාරිය, 'පොල් නිෂ්පාදන අපනයනකරුවෙකු ලෙස ලියාපදිංචිය සඳහා ඉල්ලුම් පත්‍රය' 2018 සහ '2018 වසරට ලියාපදිංචි වීම සඳහා මාර්ගෝපදේශ මාලා සහ ඇමිණුම්', http://www.cda.lk/web/index.php?option=com_content&view=article&id=28&Itemid=141&lang=en හි තිබේ: (2018) ජනවාරි හි දී ප්‍රවේශ වන ලදී.

[5] අපනයන සංවර්ධන මණ්ඩලය, අපනයනකරුවෙකු ලෙස අප.සං.මණ්. තුළ ලියාපදිංචි වීම සඳහා උපදෙස්, අප.සං.මණ්. ඉල්ලුම් පත්‍ර අංක 1 http://www.srilankabusiness.com/pdf/edb_registration.pdf හි ඇත. (2018 ජනවාරි හි දී ප්‍රවේශ වන ලදී.

[6] ඉල්ලුම්පතේ නිදර්ශකයක් සඳහා http://bnr.wp.gov.lk/sin/wp-content/uploads/2017/06/Downloads/scan0050.pdf බලන්න.

[7] ග්‍රා.නි. විසින් ලබා දෙන ලිපියේ ආදර්ශ ආකෘතියක් සඳහා http://bnr.wp.gov.lk/sin/wp-content/uploads/2017/11/Grama%20Niladhari%20Report%20(2).pdf බලන්න.

[8] අප.සං.මණ්.යේ ලියාපදිංචිය සඳහා වූ අයදුම්පතේ නිදර්ශකයක් සඳහා http://www.srilankabusiness.com/docs/registration_of_expoters.doc බලන්න.

[9] ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය විසින් නිකුත් කර ඇති "The Export Procedure of Sri Lanka" හි සඳහන් බලපත්/අවසරපත් අවශ්‍ය වන නිෂ්පාදනවල ලැයිස්තුවක් සඳහා http://www.srilankabusiness.com/ බලන්න.

[10] "තේ, මැණික් සහ ස්වර්ණාභරණ, ඛණිජ වැලි, ලී නිෂ්පාදන, ධීවර නිෂ්පාදන සහ රසායනික ද්‍රව්‍ය වැනි බලපත්‍රවලට යටත් අයිතම අප.සං.මණ්. තුළ ලියාපදිංචි කිරීමේ දී ඒ සඳහා යෝග්‍යතාවය ඇත්දැයි සලකා බැලීමට එම නිෂ්පාදනවලට අදාළ ආයතන වෙතින් ලබා ගත් සහතික කිරීම්/බලපත් අපනයනකරුවන් විසින් ඉදිරිපත් කළ යුතු යැයි" අප.සං.මණ්. වෙබ් අඩවිය ප්‍රකාශ කර සිටී. http://www.srilankabusiness.com/edb/registration.html හි දැක ගත හැකිය. (2018 ජනවාරි හි දී ප්‍රවේශ වන ලදී.)

[11] දේ.ආ.දෙ. විසින් පනවා ඇති අවම ආදායම් මට්ටම් ලබා ඇති ආයතනවලට (බොහෝ සීමාසහිත සමාගම් ද ඇතුළුව) දැනටමත් ආ.හැ.අං. ක් සහ වැට් අංකයක් ඇත (මේ පිළිබඳ වැඩිදුර තොරතුරු සඳහා http://www.ird.gov.lk/en/Type%20of%20Taxes/SitePages/Value%20Added%20Tax%20(VAT).aspx?menuid=1204 බලන්න.)

[12] ආ.හැ.අං. ලියාපදිංචි කිරීමේ අයදුම්පත්‍රයේ නිදර්ශකයක් සඳහා http://www.ird.gov.lk/en/Downloads/SitePages/Forms.aspx?menuid=1804 බලන්න. අයදුම්පත සම්පූර්ණ කිරීමට අදාළ උපදෙස් සඳහා http://www.ird.gov.lk/en/publications/Unit%20Profiles_Tax%20Payer%20Service%20Unit/Info_Doc_required_TIN.pdf බල

[13] තාවකාලික වැට් ලියාපදිංචියක් ලබා ගැනීම සඳහා වූ ඉල්ලුම්පතේ නිදර්ශකයක් සඳහා http://www.ird.gov.lk/en/publications/Unit%20Profiles_Tax%20Payer%20Service%20Unit/Form_App_Temporary_VAT.pdf බලන්න.

[14] රේගුවේ ලියාපදිංචිය සඳහා වූ අයදුම්පතේ නිදර්ශකයක් සඳහා http://www.customs.gov.lk/public/files/tin/Application_Form_For_The_Registration_Of_Importers_&_Exporters.pdf බලන්න.

[15] ASYCUDA (Automated System for Customs Data) යනු විදේශීය වෙළඳාමට අදාළ ක්‍රියා පටිපාටි ආවරණය වන පරිදි සකසා ඇති පරිගණක කරන ලද රේගු කළමණාකරන පද්ධතියකි (වැඩිදුර විස්තර සඳහා: https://asycuda.org/aboutas.asp බලන්න.

[16] Sri Lanka Customs, 'NEW METHOD FOR REGISTRATION OF IMPORTERS & EXPORTERS', available at: http://www.customs.gov.lk/public/files/tin/guide%20for%20imp%20&%20exp.pdf, [accessed on: January 2018]; රේගු නිලධාරීන් සමග කළ මූලික පුද්ගල සාකච්ඡා, 2017 දෙසැම්බර්

[17] අපනයන සංවර්ධන මණ්ඩලයේ නිලධාරීන් සමග කරන ලද මූලික පුද්ගල සාකච්ඡා, 2017 නොවැම්බර් 23.

[18] අපනයන සංවර්ධණ මණ්ඩලය, 'අපනයනකරුවෙකු ලෙස අප.සං.මණ්. තුළ ලියාපදිංචි වීම සඳහා උපදෙස්', අප.සං.මණ්. අයදුම්පත්‍ර අං. 1 සමඟ තිබේ. http://www.srilankabusiness.com/pdf/edb_registration.pdf හි දැකිය හැකි වේ. (2018 ජනවාරි හි දී ප්‍රවේශ වන ලදී.)

[19] අප.සං.මණ්. නිළධාරීන් සමඟ සිදු කළ මූලික පුද්ගල සම්මුඛ සාකච්ඡා, 2017 නොවැම්බර් 23

[20] එම.

[21] ආ. අප. පා. දෙ. ව. සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල නිලධාරීන් සමග කරන ලද මූලික පුද්ගල සාකච්ඡා, 2017 නොවැම්බර් සහ දෙසැම්බර්.

[22] ලෝක රේගු සංවිධානය, 'රේගු තැරැව්කරුවන් පිළිබඳ ලෝ.රේ.සං. අධ්‍යයන වාර්තාව', (2016), http://www.wcoomd.org/en/topics/facilitation/~/media/WCO/Public/Global/PDF/Topics/Facilitation/Instruments%20and%20Tools/Tools/Study%20Report%20on%20Customs%20Brokers/WCO%20Study%20Report%20on%20Customs%20Brokers_EN.ashx හි තිබේ. (2018 ජනවාරි හි දී ප්‍රවේශ වන ලදී.)

[23] ශ්‍රී ලංකා තානාපති කාර්යාලය, බෙල්ජියම ලක්සම්බර්ග් සහ යුරෝපීය සංවිධානය, 'මාධ්‍ය නිවේදනය' (29.06.2009), http://www.srilankaembassy.be/old/HomePagePhoto/June2009/08-06-2009/30-06-2009.pdf හි ඇති. (2018 ජනවාරි හි දී ප්‍රවේශ වන ලදී.)

[24] ලෝක වෙළඳ සංවිධානය, 'ස්ථාවර තාක්ෂණික කමිටුව' http://www.wcoomd.org/en/topics/facilitation/resources/permanent-technical-committee/~/media/9DAB50A0C2044587B1B5804C79203CCD.ashx හි ඇත. (2018 ජනවාරි හි දී ප්‍රවේශ වන ලදී.)

[25] රාජ්‍ය තොරතුරු කේන්ද්‍රය (රා.තො.කේ.), 'අපනයනකරුවන් ලියාපදිංචි කිරීම', http://www.gic.gov.lk/gic/index.php?option=com_info&id=2096&catid=94&task=info&lang=en හි ඇත. (2018 ජනවාරි 20 වන දින ප්‍රවේශ වන ලදී.)
රාජ්‍ය තොරතුරු කේන්ද්‍රය (රා.තො.කේ.), 'අපනයනකරුවන් ලියාපදිංචි කිරීම', http://www.gic.gov.lk/gic/index.php?option=com_info&id=1283&task=info&lang=en හි ඇත. (2018 ජනවාරි 20 වන දින ප්‍රවේශ වන ලදී.)
රාජ්‍ය තොරතුරු කේන්ද්‍රය (රා.තො.කේ.), 'අපනයනකරුවන් ලියාපදිංචි කිරීම', http://www.gic.gov.lk/gic/index.php?option=com_info&id=864&task=info&lang=en හි ඇත. (2018 ජනවාරි 20 වන දින ප්‍රවේශ වන ලදී.)
රාජ්‍ය තොරතුරු කේන්ද්‍රය (රා.තො.කේ.), 'අපනයනකරුවන් ලියාපදිංචි කිරීම', http://www.gic.gov.lk/gic/index.php?option=com_info&id=865&task=info&lang=en හි ඇත. (2018 ජනවාරි 20 වන දින ප්‍රවේශ වන ලදී.)

[26] ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය. "ශ්‍රී ලංකාවේ අපනයන ක්‍රියා පටිපාටි" (2017) http://www.srilankabusiness.com/ හි ඇත. (2018 ජනවාරි හිඳ ප්‍රවේශ වන ලදී.)